කොට්ඨාසයක් නියෝජනය කරමින් ජනතාවට සෘජුව වග කියන නියෝජිතයින් පත්වන මැතිවරණ ක්‍රමයක් ශ්‍රී ලාංකික ජනතාව බලාපොරොත්තු වුවද, වත්මන් සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමයෙන් සුළු/සුළු ජාතික පක්ෂ වලට පමණක් නොව, හොදම පරාජිත පක්ෂයටද ඉතා සාධාරණ නියෝජනයක් ලැබෙන නිසා, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට සියලු දේශපාලන පක්ෂ මැලිකමක් දක්වති. පක්ෂවලින් මතුවන ප්‍රතිරෝධය වලක්වා ගැනීමට නම්, වත්මන් දිස්ත්‍රික් සමානුපාතික නියෝජනය ලබා දෙන ප්‍රතිඵලයට සමාන ප්‍රතිඵල ලබාදෙන මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් කෙරෙහි අප අවධානය යොමු කල යුතුය. කලාප ක්‍රමය යනු දැනට පවතින දිස්ත්‍රික් සමානුපාතික මැතිවරණ ක්‍රමය ලබාදෙන ප්‍රතිඵලයට ඉතා ආසන්න ප්‍රතිඵල ලබාදෙන බහු ආසන මිශ්‍ර මැතිවරණ ක්‍රමයකි.



ජනක රණසිංහසාගර
පර්යේෂක (Researcher)

ජනක රණසිංහසාගර කුඩා කල සිටම මැතිවරණ ප්‍රතිපල සජීවීව අසමින් මැතිවරණ පිලිබදව උනන්දුවක් දැක්වුවෙක්. 2015 අග භාගයේ නව මැතිවරණ ක්‍රමයක් පිලිබදව කතා බහක් ඇතිවූ අවස්ථාවේ, ඔහුට මෙම ක්‍රමය පිළිබද අදහස පහල වී ඇත. ඔහු එය සංකල්පයක් ලෙස එම අවස්ථාවේ ඉදිරිපත් කලත්, ඔහු ඉදිරිපත් කල ක්‍රමය තුල මනාප ක්‍රමය යම් තාක් දුරට පැවතීම නිසා ඒ පිලිබදව කිසිවෙක් වැඩි උනන්දුවක් දක්වා නැත. නැවතත් මැතිවරණ ක්‍රමය පිලිබදව උනන්දුවක් දක්වන මේ අවස්ථාවේ, ඔහු නව දත්ත සමග තමන්ගේ යෝජනාව ඉදිරිපත් කරයි. ඔහු දැනට කැලිෆෝර්නියා විශ්ව විද්‍යාලයේ modeling and simulation පිළිබද සහායක විශේෂඥයෙකු ලෙස සේවය කරයි.